(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 193.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 ජූනි මස 19 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0773/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010.06.29 දින නිකුත් කරන ලද මූල්‍ය කළමනාකරණ වාර්තාවට අනුව, ශ්‍රේලයින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමට රුපියල් මිලියන 400 ක බැංකු ඇපකරයක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බැංකු ඇපකරය ලබා දීමට හේතු කවරේද;

(ii) එමගින් ලැබුණු ප්‍රතිලාභය කවරේද;

(iii) එම වගකීම නිදහස් කරනු ලබන දිනය කවරේද;

(iv) සමූපකාර තොග වෙළඳ සංස්ථාව, රාජ්‍ය වෙළඳ සමාගම හෝ රාජ්‍ය වෙළඳ සමූපකාර තොග සමාගම වෙත ලබා දී ඇති රුපියල් මිලියන 4200 ක බැංකු ඇපකරය නිදහස් කර නොමැති වීමට හේතු කවරේද;

(v) ඉහත කී ඇපකරය පැවතීම හේතුවෙන් ලැබෙන ප්‍රතිලාභය කවරේද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ප්‍රමාණය තවදුරටත් වැඩි කරමින් ලංකා විදුලිබල මණ්ඩලය හා ආශ්‍රිත ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන 120 ක බැංකු ඇපකරයක් ලබා දී තිබේද;

(vii) මෙම තත්ත්වය නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(viii) රජය විසින් මහජන බැංකුවේ විශ්‍රාම අරමුදලෙන් මුදල් ලබා ගැනීමට හේතු කවරේද;

යන්න ඉහත සඳහන් වාර්තාවට අනුව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1158/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන අධ්‍යාපන කලාපයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන මාර/අතපත්තුකන්ද කණිෂ්ඨ විද්‍යාලයේ ගුරු නිවාසයේ වහලයේ ලී දිරා ගොස්, දොර ජනෙල් සහ බිත්ති දැඩි සේ අබලන් තත්ත්වයට පත් වී ඇති බවත්;

(ii) එවැනි අබලන් ගුරු නිවාසයක් පැවතීම එම පාසලේ දරුවන්ගේ කටයුතුවලට අවදානමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අවදානම් සහිත ඉහත ගුරු නිවාසය ඉවත් කර නව ගුරු නිවසක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කොට තිබේද;

(iii) වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) ගුරු නිවාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(v) ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1691/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුව රාජ්‍ය හා පෞද්ගලික සේවා ආයතන සමග එකඟ වී ඇති සේවා ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් ඇති කරගත් ආයතන කවරේද;

(iii) එම ගිවිසුම් ඇතිකර ගැනීමට හේතු කවරේද;

(iv) එක් එක් ආයතනයට අදාළව ඇති කර ගත් සේවා ගිවිසුම් ආරම්භ වූ දින සහ අවසාන වන දින කවරේද;

(v) එම ගිවිසුම් ඇති කර ගැනීම සඳහා අනුමතිය ලබාදුන් අය කවුරුන්ද;

(vi) එම ගිවිසුම් යටතේ තැපැල් දෙපාර්තමේන්තුවට ලැබෙන ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2099/'11

4.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආරක්ෂක හමුදාවල සේවය කරන රණවිරුවන්හට ඔවුන්ගේ තුන්වැනි දරුවා ඉපදුන විට රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දීමට 2011 අයවැයෙන් කළ යෝජනාව ක්‍රියාත්මක කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම දීමනාව ලබා දෙනු ලබන ආරක්ෂක හමුදා නිලයන් කවරේද;

(iii) එය ලබා දීමේදී සක්‍රීය සේවය සැලකිල්ලට ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2182/'11

5.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනයේ උස්මානියා විද්‍යාලය උතුරේ පිහිටා තිබෙන ඉතාමත් පැරණි අධ්‍යාපන ආයතනයක් බවත්;

(ii) ත්‍රස්තවාදී ක්‍රියා නිසා එම විද්‍යාලයේ ගොඩනැගිලිවලට දැඩි හානි සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම විද්‍යාලයේ හානියට පත් ගොඩනැගිලි මුළුමනින්ම අලුත්වැඩියා කර නිසි ලෙස අධ්‍යාපන කටයුතු කර ගෙන යාම සඳහා සුදුසු තත්ත්වයට පත්කරදීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2234/'12

6.
ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 පෙබරවාරි 28 දින චාවකච්චේරි දිස්ත්‍රික් උසාවියෙන් දෙන ලද තීරණයකට අනුව චාවකච්චේරි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ වී. එන්. නවරත්නම් මහතාගේ පවුලට අයත්ව තිබූ චාවකච්චේරි පරණ පොලිස් ස්ථාන පටුමගෙහි පිහිටි "රාජපූපති මාලිගයි" නමැති නිවසෙහි වෙනත් පාර්ශ්වයක් පදිංචිව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සිද්ධිය පිළිබඳව අදාළ නිලධාරීන්ගෙන් වාර්තාවක් ලබා ගැනීමටත්;

(ii) නවරත්නම් මහතාගේ වැන්දඹු බිරිඳට ප්‍රමාදයකින් තොරව සහනයක් ලබා දීමටත්;

එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2236/'12

7.
ගරු පී. හැරිසන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇතිවූ ගංවතුරින් හානි සිදුවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුරින් ආපදාවට ලක්වූ පුද්ගලයින් හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් පවුලක් සඳහා ගෙවූ වන්දි මුදල කොපමණද;

(iv) ගෙවන ලද එම වන්දි ප්‍රමාණය පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව තීරණය කළේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගංවතුර නිසා පූර්ණ හානියට පත්වූ සහ අර්ධ හානියට පත්වූ නිවාස සංඛ්‍යාව;

(ii) එම නිවාස අතුරින් පූර්ණ හානියට හා අර්ධ හානියට පත් බලපත්‍ර සහිත නිවාස සංඛ්‍යාව සහ එම නිවාස සඳහා ගෙවූ වන්දි මුදල;

(iii) පූර්ණ හානියට හා අර්ධ හානියට පත් බලපත්‍ර රහිත නිවාස සංඛ්‍යාව සහ එම නිවාස සඳහා ගෙවූ වන්දි මුදල;

එක් එක් ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2283/'12

8\.
ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල අධ්‍යාපන කලාපයට අයත්, මාර/මින්හාත් ජාතික පාසලේ ලිපිකරු, කළමනාකරණ සහකාර, මූල්‍ය සහකාර, ලේඛන සහකාර (දෙමළ), රසායනාගාර සහායක (දෙමළ), කම්කරු සහ මුරකරු යන අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු සඳහා දීර්ඝ කාලයක සිට පුරප්පාඩු පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත තනතුරු පුරප්පාඩු සඳහා සුදුස්සන් පත් කිරීමට නොපමාව පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1639/'11

9\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල, මයිලගස්තැන්නේ පිහිටි රජයේ ආහාර ගබඩා සංකීර්ණයක් ලෙස ප්‍රයෝජනයට ගත් ගොඩනැගිල්ල වසා දමා ඇති බවත්;

(ii) රජයේ වාහන විශාල සංඛ්‍යාවක් එම ගොඩනැගිලි භූමියෙහි දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරිදි රජයේ සම්පත් විනාශවීමට ඉඩ හැරීම ජාතික අපරාධයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ආහාර ගබඩා සංකීර්ණය සහ අදාළ අනෙකුත් සම්පත් කඩිනමින්, ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1905/'11

10\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ අගෝස්තු මාසයේදී ඉඩම් රජයේ භුක්තියට පවරා ගැනීම සම්බන්ධව අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ගැසට් පත්‍රය නිකුත් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගැසට් පත්‍රය යටතේ රජය වෙත පවරා ගැනීමට යෝජිත ඉඩම් කවරේද;

(ii) එම ඉඩම් අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් ඉඩම් හිමියාගෙන් පවරා ගනු ලබන භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී ඉඩම් රජයට පවරා ගැනීමේ ගැසට් පත්‍රය නිකුත් කිරීමට පෙර එම ඉඩම්වල තිබූ දේපලවලට හානි සිදු කර තිබේද;

(iv) එසේ නම්, හානිකරන අවස්ථාව වන විට එකී දේපලවල වටිනාකම් තක්සේරු කිරීමක් සිදු කළේද;

(v) එම දේපල කඩා බිඳ දැමීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද;

(vi) එවැනි අනුමතියක් ලබාදීම සඳහා ඔහුට ඇති බලතල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2235/'12

11.

ගරු රාජීව විජේසිංහ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාවකච්චේරි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වී. එස්. නවරත්නම් මහතාට අයත්ව තිබූ වාවකච්චේරි පැරණි පොලිස් ස්ථාන පටුමගේ පිහිටා ඇති 'රාජපූපති මාලිගයි' නැමැති නිවසේ අනාථ ළමුන් සඳහා වූ නිවාසයක් යනුවෙන් හඳුන්වන ස්ථානයක් පවත්වා ගෙන යන බවත්;

(ii) එහි සැබෑ හිමිකරුවන් සමග විධිමත් ගිවිසුමකට එළැඹීමකින් තොරව වෙනත් පාර්ශ්වයක් විසින් අනාථ ළමුන් සඳහා වූ නිවාසය පවත්වාගෙන යාමට එම නිවස භාවිතා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ මේ වන විට රැකවරණය ලබන අනාථ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් ස්ථානය බලයලත් නිලධාරීන්ගේ විමර්ෂණයට භාජනය වන්නේද;

(iii) එම අනාථ ළමුන් සඳහා වූ නිවාසයේ රැකවරණය ලබන කිසිදු ළමයකු අපයෝජනයට ලක් නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1815/'11

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දිගිලි ඇළ හරහා ඉදිකර ඇති කනමීයගල ලෑලි පාලම දිරාපත්වීම හේතුවෙන් එය භාවිතා කරන ජනතාව දැඩි අනතුරුදායක තත්වයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ස්ථානයේ නව පාලමක් ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) මේ වනවිට ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.
ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට ලංකා ඛනිජ වැලි සමාගම විසින් ඛනිජ සම්පත් කැණීම සඳහා ටෙන්ඩර් ලබා දුන් ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ටෙන්ඩර් ලබා දීම අනුමත කළ බලධාරියා හෝ බලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2009, 2010 සහ 2011 වර්ෂවල ලංකා ඛනිජ වැලි සමාගමේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ අයගේ නම, ලිපිනය සහ එම තනතුරට අදාළ සුදුසුකම් කවරේද;

(ii) වර්ෂ 2009 සිට 2011 දක්වා ලංකා ඛනිජ වැලි සමාගම ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.
උසස් අධ්‍යාපන අමාත්‍යතුමා,— බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන),— 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජූනි 20 දිනැති අංක 1711/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012. 06. 06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*2.
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2) ,— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 64 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, එකී පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 01 දිනැති අංක 1730/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012. 06. 06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3) ,— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 02 දිනැති අංක 1730/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012. 06. 06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4) ,— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු, එකී පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 23 දිනැති අංක 1733/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු කරනු ලැබ, 2012. 06. 06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5) ,— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු, එකී පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 23 දිනැති අංක 1733/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු කරනු ලැබ, 2012. 06. 06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*9.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*13.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

14.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1430/'11

1.

ගරු අජිත් කුමාර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාලු උරුමය පදනම ආරම්භ කළ දින සිට මේ දක්වා නෙදර්ලන්ත රජය හරහා ලබාදුන් මූල්‍යමය අනුග්‍රහයන් කොපමණද;

(ii) එම අරමුදල් යොදා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගාලු කොටුව තුළ ක්‍රියාත්මක වූ පෞද්ගලික නිවාස සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා නෙදර්ලන්ත රජය ලබාදුන් සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම මුදල වැයකළ ආකාරය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය මගින් ආධාර ලබාදුන් අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එක් එක් අයට ලබාදුන් ආධාර මුදල කොපමණද;

(iii) එම මුදලින් කරන ලද කාර්යය හා ඒවායේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1631/'11

2.

ගරු රාජීව විජේසිංහ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් පනත යටතේ,

(i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;

(ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ

(iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ සහ විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

(ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2253/'12

3.

ගරු තිස්ස අත්තනායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා ව්‍යවස්ථාව අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තුන්වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේදී සලකා බලන ලකුණු මට්ටම;

(ii) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තුන්වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා 2011 වර්ෂයේදී පැවති සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව අදියර දෙකකින් සිදු කළ බඳවා ගැනීමේදී සලකා බැලූ ලකුණු මට්ටම්;

(iii) එම පළමුවැනි හා දෙවැනි අදියර යටතේ බඳවා ගැනීම් සිදු කළ දිනයන්;

(iv) එම අදියර දෙකම යටතේ බඳවා ගත් සංඛ්‍යාව;

(v) බඳවා ගත් අයගේ නම් සහ ලිපිනයන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තුන්වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සලකා බැලූ අවම ලකුණු මට්ටම කවරේද;

(ii) එම වර්ෂයේදී බඳවාගැනීම් සිදු කළ දිනයන් කවරේද;

(iii) බඳවාගත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2011 සහ 2009 වර්ෂවලදී අදාළ තනතුරට බඳවා ගැනීමේදී සලකා බැලූ ලකුණු මට්ටම් අනුව යම් පිරිසකට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2261/'12

4.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1994 මැතිවරණ සමයේ ඇති වූ ප්‍රචණ්ඩත්වය නිසා, අම්පාර, ඉරක්කාමම් 6, හාජියාර් පාරේ පදිංචි, එස්. එම්. අසීස් මහතාට අයත් දේපලවලට සිදුවූ හානිය වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින්, රු. 259,730.00ක මුදලක් වන්දි ලෙස නිර්දේශ කරමින් අංක AM/GA/REPPIA/1(V) දරන 2011.04.04 දිනැති ලිපිය මගින් තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය වෙත දැනුම් දී තිබුණත්, මේ දක්වාත් එම වන්දි මුදල් ප්‍රදානය කිරීම සිදුවී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) පුනරුත්ථාපන අධිකාරියේ අංක 255A/PV/EP/AM/IK/0002/5550 යටතේ ලියාපදිංචි වී ඇති අසීස් මහතාට හිමි එම වන්දි මුදල් නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/’11

5.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන "නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්" (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?